කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි තෙවන පරීක්ෂණය (බාහිර) - 2014/15

2019 පෙබරවාරි - අප්‍රේල්

මානව ශාස්ත්‍ර පීඨය

# බෞද්ධ සංස්කෘතිය

## සමයාන්තර චින්තා සහ බුදු දහම, ථෙරවාද හා මහායාන සම්ප්‍රදාය BUCU - E 3025

එක් කොටසකින් යටත් පිරිසෙන් ප්‍රශ්න දෙකක් ඇතුළත් වන සේ ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න.

ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි. කාලය : පැය 03 යි.

---

### I කොටස

01. ආගම වනාහී "අතිමානුෂ අධිභූතයන් කෙරෙහි ඇති විශ්වාසයයි". මෙහි යුක්ති යුක්තතාව පරීක්ෂා කරන්න.

02. ආගමේ සමාජ කාර්යභාරය පුද්ගලානුබද්ධව මෙන්ම සමාජානුබද්ධව පවත්නා අයුරු ප්‍රකට කරන්න.

03. ආර්යාගමනයෙන් ඇරඹුණු හින්දු දහම ලෝක ආගමක් දක්වා සංවර්ධනය වීමේ ඓතිහාසික විකාශය පිළිබඳ ප්‍රමාණවත් විවරණයක් සපයන්න.

04. සදාචාරාත්මක පරිපූර්ණත්වය උදෙසා ලෝක ආගම් මඟින් නිර්දේශිත ඉගැන්වීම්වල දක්නට ලැබෙන සමාන හා අසමානතා පිළිබඳ තුළනාත්මක විග්‍රහයක් කරන්න.

05. කිතුදහමේ ප්‍රභවය හා සංවර්ධනය විෂයෙහි යුදෙව් සංස්කෘතියේ බලපෑම කෙතෙක් දැයි පෙන්වා දෙන්න.

### II කොටස

06. ථෙරවාද යන්න අර්ථ නිරූපනය කරමින් එහි ව්‍යවහාරික පසුබිම ඓතිහාසික නයින් විමර්ශනය කරන්න.

07. මුල් බුදුදහමේ අනන්‍යතාව හා සුරක්ෂිතතාව විෂයෙහි ථෙරීය භික්ෂූන්ගේ මැදිහත්වීම ත්‍රිවිධ ධර්මසංගායනා ඇසුරින් විභාග කරන්න.

08. බුද්ධචරිතය අතිමානුෂීය ලක්ෂණවලින් පෝෂණය කිරීමෙහිලා මහායාන ආචාර්යවරුන් පෙළඹ වූ හේතු සාධක කවරේදැයි සාකච්ඡා කරන්න.

09. බෝධිසත්ව සංකල්පය මහායාන බෞද්ධ සම්ප්‍රදායයේ ප්‍රමුඛ ඉගැන්වීමක් වන අයුරු සනිදර්ශනව විස්තර කරන්න.

10. පහත සඳහන් මාතෘකා අතරින් දෙකකට ප්‍රමාණවත් සටහන් ලියන්න.

    i. අල් කුරාණය ii. ත්‍රිපිටකය iii. ත්‍රිමූර්තිය iv. ශුද්ධ වූ ත්‍රිත්වය

*********************************